මහසභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා පත්‍රිකාව

වාර්තා අංකය: AGM/2026/ශිෂ්‍යත්ව-01 (මාණ්ඩලික පත්‍රිකා අංක 12 ඇසුරෙන්)

දිනය: 2026 ජූලි 03

විෂය: 2023/2024 වර්ෂයන්හි ශිෂ්‍යත්ව ත්‍යාග වියදම් ඉක්මවීම් අනුව රු. 926,623.71 ක මුදලක් ලාභලාභ ගිණුමට ගැලපීම සඳහා මහසභා අනුමැතිය ලබාගැනීම.

1. හැඳින්වීම සහ පසුබිම

සමිතියේ පාලක මණ්ඩලය විසින් 2026/03/20 දිනැති අංක 12 දරන මාණ්ඩලික පත්‍රිකාව මඟින් සාකච්ඡාවට බඳුන් කරන ලද 2023/2024 වර්ෂයන්ට අදාළ ශිෂ්‍යත්ව ත්‍යාග ප්‍රදානය කිරීමේ මූල්‍ය ප්‍රතිපාදන තත්ත්වය මෙහිදී මූලික පදනම කරගනු ලබයි. මීට පෙර මහසභාව විසින් වසරකට රු. 1,200,000.00 බැගින් වසර දෙක සඳහා රු. 2,400,000.00 ක පූර්ව අයවැය ප්‍රතිපාදන අනුමත කර තිබුණි.

2. මූල්‍ය තත්ත්වය සහ පිරිවැය විශ්ලේෂණය

2023/2024 වර්ෂ සීමාවන් තුළ සුදුසුකම් ලැබූ සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ත්‍යාග පිරිනැමීමේදී සත්‍ය වශයෙන්ම දැරීමට සිදු වූ පිරිවැය මුල් සීමාව ඉක්මවා ගොස් ඇත. මූල්‍ය දත්තයන් පහත පරිදි වේ:

අනුමත අයවැය සීමාව (2023 වර්ෂය): රු. 1,200,000.00

අනුමත අයවැය සීමාව (2024 වර්ෂය): රු. 1,200,000.00

මහසභාවේ පූර්ව අනුමැතිය මත වියදම් කළ හැකි මුළු සීමාව: රු. 2,400,000.00

2023/2024 වර්ෂ සඳහා සත්‍ය වශයෙන්ම දැරූ මුළු ශිෂ්‍යත්ව වියදම: රු. 2,635,140.00

මහසභාවෙන් අනුමත කරගත යුතු අතිරික්ත වියදම:රු. 235,140.00

3. ලාභය මත බලපෑම සහ ගිණුම්කරණ ගැලපීම

ඉහත දැක්වෙන පරිදි සත්‍ය වශයෙන් දැරූ පිරිවැය (රු. 2,635,140.00) සහ ලාභ විසර්ජනයෙන් (Profit Appropriation) ශේෂව පවතින මුදල (රු. 1,708,516.29) සලකා බැලීමේදී, සමිතියේ නිවැරදි මූල්‍ය තත්ත්වය පිළිඹිබු කිරීම සඳහා පහත පරිදි මූල්‍ය ගැලපීමක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ:

දරන ලද සත්‍ය මුළු වියදම:රු. 2,635,140.00

(-) ලාභ විසර්ජනයෙන් එන ශේෂය:රු. 1,708,516.29

වියදමක් ලෙස ලාභලාභ ගිණුමට ගැලපිය යුතු වැඩිපුර මුදල:රු. 926,623.71

4. මහසභාව වෙත ඉදිරිපත් කරන යෝජනාව

සමිතියේ සාමාජිකයින්ගේ දරුවන්ගේ සුබසාධනය උදෙසා සිදුකරන ලද මෙම සත්කාර්යයේදී සිදු වූ වැයවීම් විධිමත් කිරීම පිණිස, 2023/2024 වර්ෂයන්හි ත්‍යාග ප්‍රදාන වෙනුවෙන් වැය වූ අතිරික්ත පිරිවැය පියවා ගැනීමට රු. 926,623.71 ක මුදලක් වියදමක් ලෙස ලාභලාභ ගිණුමට ගලපන ලදි. මහසභාවේ නිල අනුමැතියට ඉදිරිපත් කරමි.

යෝජනා කිරීම-　　　　　　　　　　　　ස්ථිර කිරීම-